# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.07.16 පැය 1015 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1404/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේ "රූ සිරි" නවීන රූපලාවන්‍යාගාරය විවෘත කිරීම.**

පොලිස් සේවා වනිතා ඒකකය මූලිකත්වයෙන් නවීන රූපලාවන්‍යාගාරයක් ලෙසින් වැඩිදියුණු කරන ලද පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේ කොන්ඩා කැපුම් ස්ථානය (Saloon) 2025.07.15 වන දින වැඩබලන පොලිස්පති නීතිඥ ප්‍රියන්ත වීරසූරිය මහතාගේ ප්‍රධානත්වයෙන් විවෘත කෙරුණි.

පොලිස් නිලධාරීන් පමණක් මෙතෙක් කාලයක් සහනදායී මුදලකට මෙහිදී සේවාවන් ලබා ගැනීම සඳහා අවස්ථාව උදාකර දී තිබූ අතර මින් ඉදිරියට පොලිස් නිලධාරිනියන්ට, පොලිස් පවුල්වල සාමාජිකයින්ට හා ඒ වෙත පැමිණෙන බාහිර පාර්ශවයන් වෙතද සහනදායී මුදලකට සියලුම රූපලාවන්‍ය කටයුතු සිදු කරගත හැකි පරිදි දෛනිකව විවෘතව පවතියි.

මෙහි සේවය කිරීම සඳහා පොලිස් නිලධාරීන්ගේ පවුල්වල විෂයෙහි ප්‍රවීණ සාමාජිකාවන්ට අවස්ථාව හිමිකර දීමද විශේෂත්වයකි. මෙලෙස දිවයින පුරා සේවා ස්ථාන පිහිටුවා ඒ සඳහා පොලිස් පවුල්වල සාමාජිකයන්ට අවස්ථාව හිමිකරදී ආර්ථික වශයෙන්ද පොලිස් පවුල් සවිමත් කිරීම වැඩබලන පොලිස්පතිතුමාගේ අරමුණයි

පොලිස් සේවා වනිතා ඒකකයේ වැඩ බලන සභාපතිනි නිල්මිණී සමරතුංග මහත්මිය, එම සංගමයේ සමාජිකා සන්දීපා සෙව්මිණී මහත්මිය සහ පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේ අණදෙන නිලධාරී කාන්තා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි දර්ශිකා කුමාරි මහත්මිය ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ අදහස් සහ අධීක්ෂණය යටතේ තවදුරටත් මෙම රූපලාවන්‍යාගාරය සාර්ථකව වැඩි දියුණු කිරීමට අවශ්‍ය කටයුතු ඉදිරියට සිදුකරනු ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**